# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

වාණිජ හා කළමණාකරන අධ්‍යයන පීඨය

වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි සිව්වන වසර පරීක්ෂණය (බාහිර)-2022

2025 - ජුලි

**BCOM E 4045 - සංවර්ධන ආර්ථික විද්‍යාව**

මුළු ප්‍රශ්න සංඛ්‍යාව පහයි : (05) කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න හතරකට (04) පමණක් පිළිතුරු සපයන්න.

---

ප්‍රශ්න අංක - 01

අ) සංවර්ධන ආර්ථික විද්‍යාවේ ප්‍රාථමික අරමුණු ලෙස මිනිසුන් සාක්ෂාත් කර ගැනීමට අදහස් කරන මූලික වටිනාකම් මොනවාද? කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි)

ආ) දියුණු ආර්ථිකයක් සහ සංවර්ධනය වෙමින් පවතින ආර්ථිකයකින් වෙන්කර හඳුනා ගැනීම සඳහා භාවිතා කරන වත්මන් නිර්ණායකය අදාළ උදාහරණ සමඟ පැහැදිලි කරන්න.

(ලකුණු 08 යි)

ඇ) පොසිල ඉන්ධන වලින් සූර්ය හා සුළං වැනි පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන් වෙත පරිවර්තනය වෙමින් තිරසාර සංවර්ධනයට දායක වීමට ශ්‍රී ලංකාවට ඇති හැකියාව සාකච්ඡා කරන්න. ඔබේ පිළිතුරේ දී, මෙම පරිවර්තනය මගින් කුමන තිරසාර සංවර්ධන අභිමතාර්ථ (SDGs) ලඟාකරගැනීමට හැකිවේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 12 යි)

**(මුළු ලකුණු 25 යි)**

ප්‍රශ්න අංක - **02**

අ) තාක්ෂණය , වර්ධන න්‍යායට බලපාන ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි)

ආ) සංවර්ධනය පිළිබඳ ලුවිස් න්‍යාය පැහැදිලි කරන්න.

(ලකුණු 08 යි)

ඇ) ශ්‍රී ලංකාවේ පෞද්ගලික සෞඛ්‍ය සේවා අංශය ඉතා හොඳින් වර්ධනය වන අතර, විශේෂයෙන් නාගරික ප්‍රදේශවල වැඩිවන ඉල්ලුමට පුළුල් පරාසයක සේවාවන් සැපයීම සිදුවේ. කෙසේ වෙතත්, මෙම වර්ධනය සෞඛ්‍ය සේවා සඳහා ප්‍රවේශ විෂමතා පුළුල් කිරීමට ද හේතු වී ඇත. විශේෂයෙන් අඩු ආදායම් ජනගහනය සඳහා ඉහළ සේවා පිරිවැය සහ ප්‍රමාණවත් නොවන නියාමන අධීක්ෂණයන් පිළිබඳ පවතින ගැටළු තවමත් විසඳී නොමැත. නව සම්භාව්‍ය ප්‍රතිවිප්ලව න්‍යාය භාවිතා කරමින්, ශ්‍රී ලංකාවේ පෞද්ගලික සෞඛ්‍ය සේවා අංශය,සම්පූර්ණයෙන්ම නියාමනය නොකළ,වෙළඳපොළ පදනම් කරගත් පද්ධතියක් බවට පරිවර්තනය කිරීමේ විභව බලපෑම සහ ඒහි බලපෑම , සෞඛ්‍ය සේවා ප්‍රවේශය දැරිය හැකි මිළ සහ සමස්ථ මහජන සෞඛ්‍ය කෙරෙහි බලපාන ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 12 යි)

**(මුළු ලකුණු 25 යි)**

ප්‍රශ්න අංක - **03**

ඇ) නිරපේක්ෂ දරිද්‍රතාවය සහ සාපේක්ෂ දරිද්‍රතාවය අතර වෙනස උදාහරණයක් භාවිතයෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි)

ආ) ආදායම් විෂමතාව පිළිබඳ සංකල්පය සහ ඒ සඳහා බලපාන හේතු උදාහරණ ඇසුරෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 08 යි)

ඇ) "ජනගහන වර්ධනය වැඩිවීම නිසා පවතින සම්පත් හා පරිසරය මත සැලකිය යුතු පීඩනයක් ඇති වන අතර එමගින් විභව හිඟයන්, දූෂණය වැඩි වීම සහ පාරිසරික හානි ඇති වේ". මැල්තුසියානු න්‍යාය භාවිතයෙන් මෙම ප්‍රකාශය සාකච්ඡා කරන්න.

(ලකුණු 12 යි)

**(මුළු ලකුණු 25 යි)**

ප්‍රශ්න අංක - **04**

ඇ) සංවර්ධනය වෙමින් පවතින රටක සන්දර්භය තුළ , නාගරීකරණය නිර්වචනය කර ඒ සඳහා බලපාන හේතු සහ ප්‍රතිඵල පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි)

ආ) ජන විකාශන වෙනස්කම් වලට වඩා නාගරික ප්‍රදේශවල අවකාශීය හා ව්‍යුහාත්මක වර්ධනය අවධාරණය කරමින්, නාගරික සංවර්ධනයේ පවතින ප්‍රවණතා විශ්ලේෂණය කරන්න.

(ලකුණු 08 යි)

ඇ) "මෑත කාලීන ආර්ථික අභියෝගවලින් යථා තත්ත්වයට පත්වෙමින් සිටින මධ්‍යම ආදායම් ලබන රටක් ලෙස ශ්‍රී ලංකාව, එහි කාර්මික සංවර්ධන උපාය මාර්ගය තීරණය කිරීමේදී තීරණාත්මක සන්ධිස්ථානයක සිටී. රට සාම්ප්‍රදායිකව තේ අපනයනය, ඇඟලුම් නිෂ්පාදනය සහ සංචාරක ව්‍යාපාරය මත විශ්වාසය තබා ඇත, නමුත් කර්මාන්ත 4.0 තාක්ෂණයන් හරහා එහි ආර්ථිකය නවීකරණය කිරීම සඳහා වැඩිවන පීඩනයකට මුහුණ දෙයි". ශ්‍රී ලංකාවේ සමස්ත ආර්ථික සංවර්ධනයට කාර්මිකකරණය දායක විය හැකි ආකාරය සාකච්ඡා කරන්න.

(ලකුණු 12 යි)
**(මුළු ලකුණු 25 යි)**

ප්‍රශ්න අංක - **05**

අ) සෞඛ්‍ය හා අධ්‍යාපනය සඳහා වන ආයෝජන අතර සම්බන්ධතාවය සහ ඒවා දිගුකාලීන ආර්ථික සංවර්ධනයට දායක වන ආකාරය පැහැදිලි කරන්න.

(ලකුණු 05 යි)

ආ) රටේ ආර්ථික සංවර්ධනය වේගවත් කිරීම සඳහා , ශ්‍රී ලංකාවේ පොදු (රාජ්‍ය) අධ්‍යාපන ක්‍රමය වැඩිදියුණු කිරීම සඳහා ගත හැකි විකල්ප ප්‍රතිපත්තිමය යෝජනා පැහැදිලි කරන්න.

(ලකුණු 08 යි)

ඇ) තිරසාර ආර්ථික වර්ධනය, රැකියා උත්පාදනය සහ දරිද්‍රතාවය අඩු කිරීම සහතික කිරීම සඳහා ශ්‍රී ලංකාවට ස්ථාවර සහ පුළුල් ජාතික ප්‍රතිපත්ති රාමුවක් අවශ්‍ය වේ. කාර්යක්ෂම රාජ්‍ය පාලනය සහ දූෂණ විරෝධය , රටේ ප්‍රගතිය සඳහා ඉතා වැදගත් වේ.ඒමෙන්ම , මේවාට නීතිරීති , දේපොළ අයිතිවාසිකම් සහ යහපාලන වැනි ශක්තිමත් ආයතන මගින් සහාය විය යුතුය.

ජාතික සංවර්ධනය ඉහළ නැංවීමේදී,ශක්තිමත් ආයතනවල කාර්යභාරය ඉස්මතු කරමින්,මෙම ප්‍රකාශය විස්තරාත්මකව සාකච්ඡා කරන්න.

(ලකුණු 12 යි)
**(මුළු ලකුණු 25 යි)**